# TRADITIONAL CASTE HIERARCHY AND SERVICES IN SINHALA SOCIETY (FROM THE TRADITIONAL VILLAGES IN KURUNEGALA DISTRICT)

W.M. Madu Wasala[1]

## Abstract

In any society there are economic, social, and cultural imbalances between groups of people. Sociologists have called this 'Social Stratification'. Accordingly, caste and class status are a representation of social inequality. Caste can be identified as one of the layers of stratification which is common throughout society, like the highness and lowness of the person, the social level of mankind. in practice, people with historical values who are considered superior by most of the society are Upper caste and those who are defined as inferior based on specific measurements by the same group are considered inferiors. Caste is identified as a charged condition that comes with the birth of the person and the purpose of this study is to investigate the 'Traditional Caste Hierarchy and Services in the Sinhala Society'. Field research and non field research were used in data collection for this study. The data collection techniques of observation, participant observation, questionnaires and interviews were used in the field research and the source study was done through the library references in the non-field research. The caste system of ancient Sri Lanka, which dates to the sixth century, was established by people who periodically migrated to Sri Lanka from India and established colonies here. The special feature of the Sri Lankan caste system that was formed and developed in this way is that it was shaped according to the culture of the country. It can be concluded that the Sinhalese caste system, which had a great impact on many aspects of society in this country until the recent period, is currently on the decline and many evolutions have taken place in it. But even though the society's attitudes towards caste is undergoing a change, it was revealed that it is by no means a defunct social institution.

**Keywords**: Caste, Sinhala Society, Traditional, Culture Services

[1] Counsellor, 'Unit of Kalana Mithuru', University of Kelaniya

Email: maduembogama@gmail.com https://orcid.org/0009-0002-7667-9171

Accepted the revised version: 01 December 2023. This work is licensed under C BY-SA 4.0. To view a copy of this license, visit http://creativecommons.org/licenses/by- sa/4.0/

# සිංහල සමාජයේ පැවති සාම්ප්‍රදායික කුල ධූරාවලිය හා සේවාවන් (කුරුණෑගල දිස්ත්‍රික්කයේ සාම්ප්‍රදායික ගම්මාන ඇසුරින්)


## සාරසංක්ෂේපය

කවර සමාජයක වුව ද, පුද්ගල සමූහ අතර ආර්ථික, සමාජීය හා සංස්කෘතික වශයෙන් අසමතුලිත තත්ත්වයන් පවතී. සමාජ විද්‍යාඥයන් මෙය සමාජ ස්තරායනය යනුවෙන් හඳුන්වා තිබේ. ඒ අනුව කුල හා පන්ති ස්තරායනය සමාජ අසමතා නියෝජනයකි. 'කුලය' (Caste) යනු පුද්ගලයාගේ උස් පහත් බව බන්ධු වර්ගයාගේ සමාජයීය මට්ටම ආදී වශයෙන් සමාජය පුරාම පොදුවේ විද්‍යාමාන වන ස්ථරායනයෙහි එක් ස්ථරයක් ලෙස හඳුනාගත හැකිය. සමාජයේ බහුතරය විසින් උසස් යයි දෙනු ලබන ඓතිහාසික වූ අගයන් සහිත පිරිස් කුලීනයන් ලෙසත් එම පිරිස විසින් ම නිශ්චිත මිනුම් පදනම් කොට පහත් යැයි නිර්වචනය කරනු ලබන පිරිස කුල හීනයන් ලෙසත් ව්‍යවහාරාත්මක ව සලකනු ලැබේ. පුද්ගලයාගේ උපතත් සමග ලැබෙන ආරෝපිත තත්ත්වයක් ලෙස 'කුලය' හඳුනාගැනෙන අතර මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ සිංහල සමාජයේ පැවති සාම්ප්‍රදායික කුල ධූරාවලිය හා සේවාවන් පිළිබඳව විමර්ශනයක යෙදීමයි. මෙම අධ්‍යයනය සඳහා තොරතුරු රැස් කිරීමේ දී ක්ෂේත්‍ර ගවේෂණය සහ ක්ෂේත්‍ර නොවන ගවේෂණ භාවිත කෙරිණ. ක්ෂේත්‍ර ගවේෂණයේ දී නිරීක්ෂණය, සහභාගීත්ව නිරීක්ෂණය, ප්‍රශ්නාවලි සහ සම්මුඛ සාකච්ඡා යන දත්ත රැස් කිරීමේ ශිල්පීය ක්‍රම භාවිතා කළ අතර ක්ෂේත්‍ර නොවන ගවේෂණයේ දී පුස්තකාල පරිශීලනය තුළින් මූලාශ්‍ර අධ්‍යයනය සිදු කෙරිණි. ක්‍රි.පූ. සය වැනි සියවස පමණ කාලය දක්වා දිව යන පුරාතන ලංකාවේ කුල ක්‍රමයේ අඩිතාලම වැටී ඇත්තේ ඉංදියාවේ සිට වරින්වර මෙරටට සංක්‍රමනය වී මෙහි ජනපද පිහිටුවාගත් ජනයාගෙනි. මෙලෙස ස්ථාපනය වී වර්ධනය වන්නට වූ ලංකාවේ කුල ක්‍රමයෙහි දක්නට ලැබුණු විශේෂත්වය නම් මෙරට සංස්කෘතියට අනුව හැඩගැසීමයි. මෑතකාලීන සමය වන තුරු ම මෙරට සමාජය තුළ සමාජයේ බොහෝ අංශ කෙරෙහි මහත් බලපෑමක් ඇතිකළ සිංහල කුල ක්‍රමය වත්මනේ පරිහානිය කරා ළඟා වෙමින් පවතින බවත් එහි පරිණාමයන් රැසක් සිදුව ඇති බවත් නිගමනය කළ හැකි වේ. එහෙත් මෙලෙස කුලය පිළිබඳ ව සමාජයේ පවත්නා ආකල්ප වෙනසකට භාජන වෙමින් පැවතුණ ද, එය කිසිසේත් ම සම්පූර්ණයෙන් ම අභාවයට ගිය සමාජ සංස්ථාවක් නොවන බව අනාවරණය විය.


**ප්‍රමුඛ පද** ඃ කුලය, සිංහල සමාජය, සාම්ප්‍රදායික, සංස්කෘතිය, සේවාවන්

### හැඳින්වීම

සිංහල සමාජයේ පැවති සාම්ප්‍රදායික කුල ධූරාවලිය හා සේවාවන්" යන්න මෙම පර්යේෂණය කුරුණෑගල දිස්ත්‍රික්කයේ සාම්ප්‍රදායික ගම්මාන ආශ්‍රිතව සිදුකරන ලදි. මෙරට කුල ක්‍රමය සම්ප්‍රදායානුකූලව පාරම්පරික චාරිත්‍ර ධර්ම ආරක්ෂා කොට ගනිමින් පරපුරෙන් පරපුරට පවත්වාගෙන යාමත්, ඊට අදාළ ඒ ඒ වෘත්තීන්වල නිරත වීමෙන් ආර්ථික සංවිධානයේ යාන්ත්‍රණයක් වශයෙන් ක්‍රියාත්මක වූයේ කෙසේ ද යන්න පිළිබඳවත් මෙහි දී අධ්‍යයනය කොට තිබේ. සමාජයක් යනු සංකීර්ණ ජන සබඳතා හා ආයතනික රටාවන්ගෙන් ගැවසීගත් සාර්ව ඒකකයක් ලෙස හැඳින්විය හැකිය. එය, යම් යම් සමාජ ක්‍රියාවන් හා ඒවායේ ප්‍රතිඵල ලෙසින් ගොඩනැගී පවතින සංස්ථාදියේ සමස්ත සංකලනයකි. මෙසේ පෘථුල ජන සංයුතියක් වශයෙන් සමාජය ගොඩ නැගී පැවතීම නිසා එම ජන සබඳතා හා ආයතනික රටාවන් පිළිබඳ ව යම් පෙළ ගැස්මක් දැකිය හැකි වෙයි. කවර සමාජයක වුව ද පුද්ගල සමූහ අතර ආර්ථික, සමාජීය හා භෞතික වශයෙන් අසමතුලිත තත්ත්වයන් පවතී. උස් පහත් ස්වරූපයෙන් දැකිය හැකි වූ මෙම ස්තරගත බව සමාජයීය ප්‍රතිලාභයන්ගේ අසමාන වූ ව්‍යාප්තියට අනුරූප ව සමාජය තුළ ආරම්භයේ සිටම දක්නට තිබූ බවට සාධක ඇත. ඒ අනුව 'කුලය' (Caste) යනු පුද්ගලයාගේ උස් පහත් බව බන්ධු වර්ගයාගේ සමාජයීය මට්ටම ආදී වශයෙන් සමාජය පුරාම පොදුවේ විද්‍යාමාන වන ස්තරායනයෙහි එක් ස්තරයක් ලෙස හඳුනාගත හැකිය.

### සාහිත්‍ය විමර්ශනය

සිංහල සමාජයේ පැවති සාම්ප්‍රදායික කුල ධූරාවලිය හා සේවාවන්" යන්න මෙම පර්යේෂණය සාර්ථක කර ගැනීම උදෙසා පුස්තකාල පරිශීලනය තුළින් මූලාශ්‍ර අධ්‍යයනය ප්‍රධාන වශයෙන් උපයෝගි කොට ගෙන තිබේ. එහි දී විශේෂයෙන් 'කුලය' පිළිබඳව ලියවුණු පැරණි ග්‍රන්ථාගත විමර්ශනාත්මක තොරතුරු මෙම කාර්යය සඵලත්වය සඳහා බෙහෙවින් උපකාරි කොටගෙන ඇති අතර එය සාම්ප්‍රදායික තොරතුරු විස්තරාත්මක ගවේශණයකට මහත් පිටුවහලක් වීය.

සමාජයේ බහුතරය විසින් උසස් යයි දෙනු ලබන ඓතිහාසික වූ අගයන් සහිත පිරිස් කුලීනයන් ලෙසත් එම පිරිස විසින් ම නිශ්චිත මිනුම් පදනම් කොට පහත් යැයි නිර්වචනය කරනු ලබන පිරිස කුල හීනයන් ලෙසත් ව්‍යවහාරාත්මක ව සලකනු ලැබේ (අමරසේකර, 1988). *ජනවංශය, නීති නිඝණ්ඩුව* වැනි පුරාතන ලේඛනයන්හි

සඳහන් වන තොරතුරු අනුව කුල ප්‍රභේදනය තම තමන්ගේ පොදු අභිමතාර්ථය අරමුණු කොට තම තමන්ට කළ හැක්කා වූ යම් යම් ආර්ථිකමය කෘත්‍යයන් අනුසාරයෙන් පුරාතන ප්‍රජාව විසින් ම දූන නියම කර ගත් කාර්යයකි. ඒ අනුව ක්‍රි.පූ. පස්වන සියවසේ ඉන්දියාවේ සිට මෙරටට පැමිණි ආර්යයන් එම සමාජයේ පැවැති විවිධ පන්තීන්හි උස් පහත් භේදය ද මෙරටට රැගෙන ආ අතර ඉන්දීය කුල ක්‍රමයේ දක්නට ලැබෙන බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍ය හා ක්ෂුද්‍ර යන සිව් වැදෑරුම් කුල ක්‍රමයට අනුරූප ව මෙරට රජ, බමුණු, වෙළෙඳ, ගොවි ආදි කුල පන්ති සංස්ථාපනය විණි. ශ්‍රී ලාංකේය ජන සමාජය තුළ දක්නට ලැබෙන කුල පද්ධතිය ඉන්දියානු කුල ක්‍රමයේ වක්‍ර වූ ආභාසය ලැබූවක් බවත්, ඒ අනුව චතුර් වර්ණ හා ජාති හෙවත් උපකුල වශයෙන් දෙයාකාර ව බෙදී ගිය ඉන්දියාවේ මූලික කුල පද්ධතිය ශ්‍රී ලංකාව තුළ බෙදී ගොස් ඇත්තේ 'ජාති' සංකල්පය පදනම් කරගෙන බවත් අඩු ජාතියේ මිනිසුන්.., ජාතියෙන් වෙනස්.., ආදි පුද්ගල හඳුනාගැනීම් සඳහා යොදනු ලබන යම් යම් ව්‍යවහාරාත්මක යෙදුම් තුළින් එකී ජාති සංකල්පය පෙන්නුම් කෙරෙන බවත් සමාජ විද්‍යාඥයින්ගේ අදහසයි.

18 වන සියවසේ මෙරට පැවති කුල ක්‍රමය පිළිබඳ අදහස් දක්වන *ආනන්ද කුමාරස්වාමි* මහතා භාරතීය හින්දු සමාජයේ පැවති චතුර් වර්ණයන්ගෙන් සමන්විත කුල ක්‍රමයට වඩා ලංකාවේ කුල ක්‍රමය සමාන වන්නේ දකුණු ඉන්දියානු ද්‍රවිඩ කුල ක්‍රමයට බව පවසයි. බෞද්ධ පසුබිමක් තුළ බ්‍රාහ්මණයන්ට ඉමහත් තැනක් නොලැබුණු හෙයින් ද, ක්ෂත්‍රියයන්ගේ ප්‍රමාණය සීමා සහිත වූ බැවින් ද, ගොවි කුලයට සමාජයේ ඉහළ තැනක් ලැබුණු බවත්, මෙරට වැසියන්ගෙන් සියයට අනූවකට වඩා ගොවි කුලයට අයත් වූ බවත් ඔහු සඳහන් කරයි (කුමාරස්වාමි, 1962). පසු කලෙක අනුක්‍රමයෙන් කුල ක්‍රමය අභාවයට ගිය නමුදු බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍ය, ශුද්‍ර යන සිව් වැදෑරුම් කුලක්‍රමයක් සිංහලයන් අතර ප්‍රචලිතව පැවති බවට *රැල්ෆ් පීරිස්* මහතා අදහස් දක්වයි (පීරිස්, 2001). මෙම සිව් වැදෑරුම් කුල ක්‍රමය පිළිබඳව තව දුරටත් පිරික්සීමේ දී මහාවංසයේ සඳහන් කරුණු අනුව විජය සමඟ මෙරටට පැමිණි උපතිස්ස නමැත්තා බ්‍රාහ්මණ වංශිකයෙකි. විජයගේ ඇවෑමෙන් පඬුවස් දෙව් පැමිණෙන තෙක් සිංහාසනයට උරුමකරුවකු නොසිටි බැවින් ලක් රජය විචාරීම මෙම බ්‍රාහ්මණාංශිකයාගෙන් සිදුවිණි. රජ පවුලේ සාමාජිකයින් හා රජ පවුලට සම්බන්ධ පිරිස් ක්ෂත්‍රිය කුලයට අයත් විණි. බමුණු කුලය උපදේශාත්මක සේවාව සපයන්නන් සඳහා පැවතිය ද, ක්ෂත්‍රියයෝ සෘජුවම රාජ්‍ය විචාරීමට උරුමකම් කියන ලදි. මහාවංශය විජය කුමන කුලයකට අයත් දැයි සඳහන් නොකළ ද, විජයගේ සොහොයුරු වූ සිංහපුරයේ සුමිත්‍රගේ පුත්‍ර පණ්ඩුවාස දේවයන් ක්ෂත්‍රියකු බැව් සඳහන් කරයි (රණවැල්ල, 2014). පණ්ඩුකාභය හා ඔහුගේ මාමාවරුන් ද ක්ෂත්‍රිය වංශිකයන් ලෙස හඳුනාගෙන ඇත. ගහපති හෙවත් වෛශ්‍ය කුලය බ්‍රාහ්මණ කුල න්‍යායට අනුරූපව ලංකාවේ බෙදී පැවතුණු උසස් කුල තුනෙන් විශාලතම කුලය ලෙස සැලකේ. වෙළෙඳාම හා ගොවිතැන මේ කුලයට අයත්ව පැවති බැව් ප්‍රකට ය. 'ශුද්‍ර කුලය' කුල අතර පහත්ම කුලය නියෝජනය කරයි. සෙසු වර්ණත්‍රයට මෙහෙකර ඉන් යැපීම ශුද්‍රයෙකුගේ කාර්යය වූ බවට ලංකාවේ කුල රටා පිළිබඳ පසුකාලීන රචනාවන් විමසීමෙන් පැහැදිලි වෙයි. මේ අනුව මෙරට කුල ක්‍රමයෙහි මූලය විජයාවතරණය තෙක්ම දිවයන බැව් පැහැදිලි වේ. ඒ ඒ කෘත්‍ය කරවා ගැනීමට සුදුස්සන් නැති වූ කල විජය කුමාරයා කලින් කල පඬි රටට හසුන් යවා මෙහෙකාරයන් ගෙන්වා ඔවුනට නිසි කෘත්‍යය හා කළයුතු සත්කාර ද නියම කරවා ඔවුන් ලංකාව තුළ පදිංචි කරවූ බවට ඉතිහාසය සාක්ෂ්‍ය දරයි. මෙසේ විජයගේ ඇවෑමෙන් මෙරට මුල් බැස ගත් කුල පදනම මහින්දාගමනයත් සමඟ මෙරටට පැමිණියා වූ විවිධ කර්මාන්ත පදනම් කරගත් ශ්‍රේණිවලට අයත් ජනයා විසින් ද යළිත් වරක් වඩාත් විස්තීර්ණ ව ව්‍යාප්ත කළ බැව් පෙනේ. ලක්දිවට පැමිණි කුල ප්‍රවේණි වූ ජනකොට්ඨාස පිළිබඳ විමසීමේ දී දේවානම්පියතිස්ස රාජ්‍ය පාලන අවධිය තුළ ශ්‍රී මහා බෝධීන් වහන්සේ සමඟ මෙරටට පැමිණි විවිධ කුල ගෝත්‍රවලට අයත් පවුල් ඒ ඒ පෙදෙස්වල පදිංචි කරවීම, ඔවුනට ගම්බිම් හා තනතුරු දීම වැදගත් වේ. ඒ පිළිබඳ තොරතුරු *මහාවංශය, සමන්තපාසාදිකා විනයට්ඨ කථාව* හා වෙනත් ඓතිහාසික ග්‍රන්ථයන්ගෙන් තහවුරු වේ. *මහාවංශය* සඳහන් කරන අයුරින් දේව කුල 18 ක් ද, ඇමති කුල 8ක් ද, බ්‍රාහ්මණ කුල 8ක් ද, වෛශ්‍ය කුල 8ක් ද, ගොපක, තරච්ජ, කුලිංග කුලයෝ ද, පේෂකාර කුම්භකාර යන කුලයෝ ද, සේනා සම්බන්ධ කුලයෝ ද, නාග කුලයෝ ද, මහා බෝධීන් වහන්සේ ආරක්ෂා කිරීමට දිවයිනට පැමිණ ඇත (ශ්‍රී සුමංගල නාහිමි සහ බටුවන්තුඩාවේ දේවරක්ෂිත පඬිතුමා, 1969).

මෙරට කුල ක්‍රමයේ ප්‍රාරම්භක තත්ත්වය විමසීමේ දී, එහි බොහෝ කුලයන් ගෝත්‍රික හා ජාතික සම්භවයකට උරුමකම් කියන හෙයින්, වෘත්තීන් පදනම් කොට ගෙන ම ඇති වූ බෙදීම් නොවන බවට ප්‍රකට ඉතිහාසඥයකු වන *ජී. සී. මැන්දිස්* මහතා අදහස් දක්වා තිබේ. (මැන්දිස්, 1956). මෙයින් පැහැදිලි වන්නේ මෙරටට පැමිණීමට පෙර ඉන්දියාවේ යම් යම් ශිල්පීය කර්මාන්තයන්ට හුරුව සිටි ගෝත්‍රික පිරිස් මෙරටට පැමිණීමෙන් පසු මෙහි සමාජ සංවිධානයන්ට අනුකූල ව ඔවුන්ට ආවේණික වූ වෘත්තීමය අංශ කේන්ද්‍ර කොට වෙන ම සංවිධානය වූ බවයි. ඒ ඒ ප්‍රදේශයන්හි විසිරී පැවැති භෞතික සම්පත් හා රැකියා මාර්ග මෙහි ලා තමන් සතු හැකියාවන්ට අනුකූල ව ප්‍රයෝජනයට ගැනීමට ද, එමඟින් වෙනම සංවිධිත වූ පිරිස් වශයෙන් සංවිධානය වීමට ද මේ අය පෙලඹී ඇත. ඒ ඒ කුලවල සම්බන්ධය රැකී රක්ෂා හා වැඩවසම් ක්‍රමයක් යටතේ වූ සේවයක් අනුව වෙන් කොට දක්වීමේ ලැදිකමක් මුළු ලංකාව පුරාම පැතිරී තිබූ බව ප්‍රවීණ මානව විද්‍යාඥ *බ්‍රයස්රයන්*, නූතන ලංකාවේ කුලය පිළිබඳව කරනු ලැබූ අධ්‍යයනයන්හි දී පෙන්වා දෙනු ලබයි (රණසිංහ, 2015). ඒ අනුව බොහෝමයක් කුල

ලංකාවේ පදිංචියට පැමිණි ගෝත්‍රික කණ්ඩායම් ලෙසත්, මේ සියලු කණ්ඩායම් මෙරටට පැමිණීමට පෙර සිට ම නියත තරාතිරමක් හෝ තත්ත්වයක් ඇතිව සිටින්නට ඇති බවත්, තවත් කුලයන් ඒ ඒ කර්මාන්තයන් හි වෙනස්කම් අනුව හෝ සිංහල සමාජයේ ම ඇති වූ අන්කිසි කැඩී බිඳී යෑම් හේතු කොට ගෙන හෝ බිහිවන්නට ඇති බවත් ඔහු ප්‍රකාශ කරයි.

ලංකාවේ කුල භේදය පිළිබඳ රචිත පැරණි ම මානව විද්‍යාත්මක ග්‍රන්ථය ලෙස *'ජනවංශය'* සැලකේ. එහි සඳහන් පරිදි ඒ ඒ කුලයන්ගේ අනුක්‍රමික නිර්මිත ය පහත පරිදි වෙයි (අමරසේකර, 1988, පි.17).

1. ගොවියෝ (හන්දුරුවෝ, වෙල්ලාලයෝ)
2. පේසකාරයෝ (සලාගමයෝ, හාලි වියන්නෝ)
3. කඹුරෝ (නවන්දන්නෝ, ගල්ලද්දෝ, ආචාරියෝ)
4. වඩුවෝ (වඩුවෝ, යකඩ වැඩ කරන්නෝ)
5. හන්නාලි (මහන්නෝ, ගෙත්තම් කරන්නෝ)
6. රදවු (රෙදි සෝදන්නෝ)
7. ඇම්බැට්ටයෝ (කරණවෑමියෝ)
8. සොම්මාරයෝ (හම් වැඩ කරන්නෝ, පාවහන් සාදන්නෝ)
9. දුරාවෝ (රා මදින්නෝ)
10. කුම්භකාරයෝ (බඩහැලයෝ)
11. කරාවෝ (මාළු අල්ලන්නෝ)
12. වැද්දෝ (දඩයම් කරන්නෝ)
13. බෙරවායෝ (නැකතියෝ)
14. හකුරුවෝ (හකුරු හදන්නෝ)
15. හුන්නෝ (හුණු පුළුස්සන්නෝ)
16. පන්නයෝ (තණකොළ කපන්නෝ)
17. යමන්නෝ (යකඩ උණු කරන්නෝ)
18. වැල් වඩුවෝ (වේ වැල් වැඩ කරන්නෝ)
19. ගහලයෝ (පහත් මෙහෙකාරකම් කරන්නෝ)
20. පදුවෝ (පල්ලැක්කි ගෙන යන්නෝ)
21. මාලාකාරයෝ (පහන්, මල් කරුවෝ, උයන් පල්ලෝ)
22. කින්නරයෝ (පැදුරු වියන්නෝ)
23. රොඩියෝ (කඹ හදන්නෝ - හම් පදම් කරන්නෝ)
24. ඔලියෝ (නටන්නෝ)
25. ඉන්ද්‍රජාලිකයෝ (ඇස් බැන්දුම්කාරයෝ)
26. චණ්ඩාලයෝ (ගෙරිමස් කන්නෝ) වශයෙනි.

අංක 04 සිට 08 දක්වා (වඩුවෝ, හන්නාලි, රදවු, ඇම්බැට්ටයෝ, සොම්මාරයෝ) ලෙස දැක්වූ කුල පහ පෞද්ගලික සේවය සඳහා වෙන් වූ බැව් ඉහත ධූරාවලිය පිරික්සීමේ දී පැහැදිලි වේ. රජ, බමුණු, ගහපති, වෙළඳ, ශුද්‍ර යන සියල්ලන්ගේ මංගල්‍ය, අවමංගල්‍ය, උත්සව ආදි කටයුතු සඳහා වඩුවා ඇඳ, පුටු, මඩු ආදිය සැපයීමෙන් ද, සන්නාලියා ඇඳුම්, තොප්පි සැපයීමෙන් ද, කරණවෑමියා හිස රැවුල් බෑමෙන් ද, සොම්මාරයා පාවහන් මැසීමෙන් ද, පංච කුලයන්ගෙන් පස්වැදෑරුම් කෘත්‍යයන් ඉටුකරගෙන තිබේ. තව ද එකම ශිල්පීය කර්මාන්තයන්ගේ පවතින සියුම් ව්‍යුහයීය බෙදීම් කරණකොට ගෙන මිනිසුන් කුල වශයෙන් වෙන් වී සිටි බැව් මෙම කුල ධූරාවලිය ඔස්සේ පෙනී යයි. උදාහරණ වශයෙන් "ආචාරීන්" යකඩ ලෝහයන් පිළිබඳ කර්මාන්තයන් හි නියැලී සිටිය ද, එම කර්මාන්තය තවත් සුවිශේෂී බෙදුම් ගණනාවකට වෙන්ව පැවත තිබේ.

1. කඹුරෝ - රං රිදී වැඩ කිරීම
2. වඩුවෝ - යකඩ වැඩ, වඩු වැඩ කිරීම
3. යමන්නෝ - යකඩ උණු කිරීම
4. රොඩියෝ - තඹ හැදීම ආදි වශයෙනි.

යකඩ උණු කිරීම, තඹ සැදීම වැනි රළු හා කටුක කාර්යයන් පහළ මට්ටමේ ආචාරින්ට නියමිත ව පැවතිණි. යමන්නන්, රොඩියන් ලෙස ඔවුන් හැඳින්විණි. ස්වර්ණාභරණ නිපදවීම හා අලෙවිය උසස්තම ආචාරි වෘත්තීන් ලෙස සැලකිණි. මේ අනුව සමාජ ව්‍යුහය තුළ විසිරී පවතින භෞතික සම්පත් මිනිසා විසින් පරිහරණය කරනු ලබන ආකාරය, පෙරළා ඔහුට හිමි තත්ත්වය හා කාර්ය කොටස නියම කර දී ඇති බව පැහැදිලි වේ.

යටත්විජිත යුගයේ කුල ක්‍රමය පැවති ආකාරය පිළිබඳව බ්‍රයිස් රයන්ගේ 'නූතන ලංකාවේ කුල ක්‍රමය' කෘතියෙහි ඉතා දීර්ඝව විස්තර කොට තිබේ. විදේශීය ලේඛකයන් විසින් විස්තර කර තිබෙන කුල ධූරාවලිය අනුසාරයෙන් වත්මන් සමයේ පවතින කුලක්‍රමයට උචිත ආකාරයේ ප්‍රවේශයක් ඉදිරිපත් කිරීමට රයන් මෙහිදී උත්සාහ දරා තිබේ. කුල ක්‍රමයේ ගතානුගතික මුහුණුවරට යටත්විජිත බලපෑම තිබූ බව රයන් පිළිගනී. කුලයක උසස් පහත් තත්ත්වය කෙසේ නිර්ණය වේද යන්න ගැන සඳහන් කරන රයන් කුල ක්‍රමය සමස්තයක් ලෙස ගත් කල එය එහි තරාතිරම, ගෞරවය හා වරප්‍රසාදවල මට්ටම් සමඟ බැඳී තිබුණ ද එක් කුලයක් අනෙක් සෑම කුලයකට සාපේක්ෂ වශයෙන් උසස් හෝ පහත් මට්ටමකින් යුතුව අවශ්‍යයෙන් ම ස්ථාවර ලෙස නොපවතී ය යන්න අදහස් ඉදිරිපත් කරයි. මෙරට 1940 -50 ගණන්වල පැවති කුල ගැන වෙන වෙනම විශ්ලේෂණයක නිරත වන බ්‍රයිස් රයන් පදවිනාම සහිතව තරාතිරම පිළිබඳ ආසන්න අනුපිළිවෙළ අනුව සැකසූ සමකාලීන කුල සහ උපකුල ඉදිරිපත් කරනු ලබයි (රණසිංහ, 2015, පි. 143-144).

1. ගොවි වංශය (ගොයිගම) ගොවිතැන් කරන්නෝ
   උපකුල -
   - රදළ - රජුගේ නිලතල දරන්නෝ
   - මුදලි - ජන ප්‍රධානීහු
   - පට්ටි - රජුගේ ගවයන් බලා ගන්නා අය
   - කටුපුල්ලේ - රජුගේ ලේඛන කටයුතු කළ සේවකයෝ
   - නිලමක්කාර - පූජනීය ස්ථානවල සේවය කළ අය
   - පොරවක්කාර - රජ වාසලට දර සැපයූ අය
   - වහල් - රදළයන්ගේ නිවෙස්වල දාසකම් කළ අය
   - ගත්තර - ගොයිගම කුලය තුළ හීන කුලය
   - ගුරුවෝ - සක් පිඹින්නෝ
2. කරාව
   උපකුලය - කරාව පොරොවක්කාර
3. සලාගම
   උපකුල - හේවාපන්න - සෙබලු
   - කුරුඳුකාර - කුරුඳු තළන්නෝ
4. දුරාව - රා මදින්නෝ
5. නවන්දන්නා (ආචාරි) - සියලු ආකාරයේ ලෝහ වැඩ කරන්නන් ඇතුළු ශිල්පීහු
6. හන්නාලි - ඇඳුම් මසන්නෝ
7. හුණු - හුණු පුලුස්සන්නෝ
8. හේන හෙවත් රදා - උසස් කුලවල රෙදි සෝදන්නෝ
9. වහුම්පුර (හකුරු) - හකුරු තනන්නෝ
10. හින්නා (හිනි) - සලාගම කුලයේ රෙදි සෝදන්නෝ
11. බඩහැල - වළං තනන්නෝ
12. පනික්කි - කරණවැමියෝ
13. වෙල්ලි - දුරයි - ශ්‍රී මහ බෝධිය රැකබලා ගන්නෝ
14. පන්න - දුරයි - තණකොළ කපන්නෝ (විය හැකිය)
15. බෙරවා - බෙර වයන්නෝ
16. බත්ගම් බෙරවා - බෙර වයන්නෝ
17. කොන්තදුරයි - අප්‍රකට
18. බත්ගම්(පදු) - රජුගේ දෝලාව උසුලාගෙන යන්නෝ විය හැකිය
19. ඔලී - නැට්ටුවෝ
20. පලී - පහත් කුලවල අයගේ රෙදි සෝදන්නෝ
21. කින්නර - පැදුරු වියන්නෝ
22. ගහල බෙරවා - මළ බෙර වයන්නෝ සහ වධකයෝ

23. රොඩී - හීන කුල යාචකයෝ

ධූරාවලිය අනුව ශ්‍රේණිගත නොකළ ඒවා

25. කවිකාර - දේවාලවල නැට්ටුවෝ සහ ස්තෝත්‍ර ගයන්නෝ
26. දෙමළ - ගත්තර - ද්‍රවිඩ කුලහීනයෝ

බ්‍රයිස් රයන් මෙම සාම්ප්‍රදායික කුල ධූරාවලිය පිළිබඳ තොරතුරු විශ්ලේෂණයේ දී එහි ප්‍රථම ස්ථානය ලැබෙන්නේ ගොවිගම කුලයට බව සඳහන් කරයි. ඔහුට අනුව 'ගොයිගම' යනු වගා කරන්නන්ගේ හෙවත් ගොවියාගේ කුලයයි. මෙය සිංහල කුල ධූරාවලියේ උච්චස්ථානය වේ. ගොවිගම කුලය සිංහල සමාජයේ අඩක් පමණ ප්‍රමාණයකින් සමන්විත වේ. සංඛ්‍යාත්මක අතින් ඔවුන් දරන වැදගත්කම අසමසම වූවකි. දිවයිනේ බොහෝ ප්‍රධාන සිවිල් පරිපාලන කොට්ඨාස තුළ කරන ලද ඍජු නිරීක්ෂණ අනුව දැක්වෙන්නේ සංඛ්‍යාත්මක වශයෙන් ප්‍රධානම ජන කණ්ඩායම වන්නේ ගොයිගම කුලය බව යි. මෙම කුලය අතීතයේ දී ලංකාවේ අධිපති බවේ තත්ත්වයට හිමිකම් කියන ලදි. එය මූලික වශයෙන් ඉහළ කුලවලට හිමිව තිබූ විශේෂ වරප්‍රසාදයකි. ගොවි වංශයේ අය වරප්‍රසාද ලත් ජනයා වන අතර රාජ්‍යයේ සෑම ගෞරවයක් ම භුක්ති විඳිමින් රටේ සියලුම පාරම්පරික නිලතල දරතැයි දහනම වන සියවසේ මුල් භාගයේ දී ඩේවි විසින් සඳහන් කර තිබේ (රණසිංහ, 2015). ගම්බද ප්‍රදේශවල ඉතාමත් ප්‍රබල සහ ධනවත් ම පුද්ගලයන් සාමාන්‍යයෙන් ගොවි කුලයේ අය වන නමුදු භෞතික වශයෙන් ගත් කල ඔවුන්ගේ බහුතරය සාමාන්‍යයෙන් ජීවත් වන්නේ ද අඩු කුලයේ තම අසල්වාසීන්ට වඩා සුළු වශයෙන් ඉහළ, නැතහොත් ඔවුන් හා සම තත්ත්වයෙනි. ඉතාමත් ගරුත්වයෙන් යුත් බොහොමයක් 'ගේ' පෙළපත්වල ආසන්නම මුතුන්මිත්තන් රජුගේ ගරුකටයුතු උසස් තනතුරු දැරූ අය හෝ වස්තුවට හිමිකම් කී අය බව පෙනෙන්නට ඇත. 'ගේ' පෙළපත්වලින් බොහෝ විට හැඟවෙන්නේ පුරාතන සමයේ පටන් ඉසුලූ නම්බුකාර තත්ත්වයන් ය. විවාහ වැනි අන්තර්ක්‍රියා ගනුදෙනු සිදු කිරීමේ දී කුල විෂමතාවන් සැලකිල්ලට ගත්ත ද එදිනෙදා සිදුවන සාමාන්‍ය ක්‍රියාවල දී නම්බුව පිළිබඳ එබඳු විෂමතාවන් සැලකිල්ලට නොගනිති.

බ්‍රයිස් රයන්ගේ කුල ධූරාවලියට අනුව කරාව කුලයට අයත් ජනයා මසුන් ඇල්ලීමේ කටයුතුවල නිරත වෙති. මොවුන් බහුල වශයෙන් ඒකරාශීගත ව සිටින්නේ හලාවත සිට හම්බන්තොට දක්වා ඇති වෙරළබඩ ප්‍රදේශයෙහි ය. වෙරළ තීරයේ සිට යාර 50 ක් රට ඇතුළු ප්‍රදේශයට වන්නට, මීගමුවේ සිට තංගල්ල දක්වා ඇති බිම් තීරුව විමසුමට ලක්කළ හොත් කරාව කුලයේ ජනයා බොහෝ දැකිය හැකි බව රයන් පවසයි. මෙය ගොයිගම කුලයට වඩා බෙහෙවින් කුඩා කුලයක් ලෙසට ඔහු හඳුන්වයි.

නවන්දන්නා හෙවත් ආචාරි කුල සම්ප්‍රදාය අනුව එම ජනතාව රිදී වැඩකරුවෝ, කම්මල්කරුවෝ, සහ තඹ වැඩකරුවෝ වෙති. එමෙන් ම ඔවුහු වඩුවෝ සහ දැව වැඩකරුවෝ ද වෙති. ඩේවිට අනුව, 'ආචාරි කුලය, පහත් කුල අතර මුල් තැන උසුලයි. එය රිදී වැඩකරුවන්, කම්මල්කරුවන්, පිත්තල වැඩකරුවන්, ලියවන්නන්, පිළිම අඹන්නන් ආදීන්ගෙන්......'සමන්විත වූවකි (රණසිංහ, 2015, පි. 171). මෙම කුලය සැලකිය යුතු ජනකායකින් සමන්විත වෙයි. මුලුමනින් ම මෙම කුලයන්ගෙන් සමන්විත කෘෂිකාර්මික ගම් දක්නට පැවති අතර බොහෝ දෙනා ගොවිතැන් කිරීමත් සමග ම නිරතුරුව තම සාම්ප්‍රදායික කර්මාන්තයන්හි ද නිරත ව ඇත. එසේ වුව ද ඔවුන්ගේ ගම් බහුතරයක් වශයෙන් දක්නට නැත. විශේෂයෙන් ගොයිගම ගම් බොහෝමයක මෙම නවන්දන්නා කම්මල්කරු පවුල් එකක් හෝ දෙකක් පදිංචිව සිට ඇති අතර තමන්ට ආවේණික ශිල්පයේ ඔවුහු නිපුණයෝ වූහ.

රයන්ගේ විග්‍රහයට අනුව 'හන්නාලි' බොහෝ ජනයාගෙන් සමන්විත කුලයක් නොවූහ. 'මුල දී ඔවුන්ගේ රාජකාරිය වී තිබුණේ තමන් භුක්ති විඳින ඉඩම්වල හිලව්වට රජුගේ සහ ඔහුගේ රජවාසල අයගේ ඇඳුම් මසා දීම යැයි' ඩේවි පවසයි (රණසිංහ, 2015). නූතනයේ මෙම ජනයා මුලුමනින් ම පාහේ අභාවයට ගොස් ඇති අතර යම් හෙයකින් එසේ දක්නට සිටිය ද ඔවුහු ඇඳුම් මැසීමේ ශිල්පයේ තව දුරටත් නියැලී නොසිටිති.

රදවු හෙවත් හේන කුලයේ ජනයා සිංහලයන් සිටින සෑම ප්‍රදේශයක් පුරාම ව්‍යාප්තව ගොස් සිටී. හේන කුලයේ සාමාජිකයන්ගෙන් සමන්විත ගම් බොහොමයක් දක්නට තිබේ. කෘෂිකර්මයෙහි යෙදී සිටිය ද උසස් කුලවල ජනයා ඉතා බහුල වශයෙන් සිටීම හේතුවෙන් ඔවුන්ගේ රෙදි සේදීමේ කර්තව්‍යය ඒකාධිකාරයක් වශයෙන් පැවරී ඇත්තේ හේන කුලයට ය. වර්තමානයේ ඔවුන්ගේ බොහෝ දෙනෙක් නාගරීකරණයට පත්ව වෘත්තීමය වශයෙන් වෙනත් කාර්යයන්වල නිරතව සිටිනු දැකිය හැකි වුව ද ඔවුන්ගෙන් බහුතරය ගම්වල වාසය කරති. ගමේ ජීවිතයට අදාළව රෙදි සෝදන්නන්ගේ භූමිකාව බෙහෙවින් ම වැදගත් වන්නේ ඔහුගෙන් ඉටු වන ආර්ථික කාර්යයන්ට වඩා උත්සවවල දී ඔවුන් ඉටු කරන චාරිත්‍ර විධිවලට අදාළ කාර්යයන් සැලකීමේ දී ය. මංගල උත්සවයන්හි දී සහ අනෙකුත් විශේෂ උත්සවයන් හි දී රෙදිවලින් සැරසීමේ චිරාගත චාරිත්‍රය පවත්වාගෙන යාමේ වගකීම උසුලන්නේ රෙදි සෝදන්නන් විසිනි. මල්වර චාරිත්‍ර වැනි කටයුතුවල දී ඔවුනට විශේෂ කාර්යයන්

ඉටුකිරීමට පැවරී තිබෙන අතර එහි දී සුදු පිරුවට සැපයීම සහ සේදීම ප්‍රමුඛ වෙයි. තත්ත්වය අතින් ඔවුන් පහත් වුව ද උසස් කුලයේ කිසිදු ගැමියෙකු විසින් තමන් පහත් ලෙස සලකන අනෙකුත් කුලවලට ඔවුන් සමාන කර නොදක්වන්නේ ඔවුන් දෙස ස්නෙහවන්තව සහ ලැදි ආකාරයකින් බලන හෙයිනි. තම පවුලේ පහළ මට්ටමේ සාමාජිකයකු වශයෙන් සලකනු ලබන ඔවුන් උසස් කුලයේ ගැමියෝ 'හේනේ මාමා හෝ හේනේ නැන්දා' යනුවෙන් අමතනු ලබති.

හකුරුවෝ හෙවත් හකුරු මිනිස්සු යන විරුදාවලියෙන් හඳුන්වනු ලබන මෙම මිනිසුන් විසින් කිතුල් ගස් මැද ඉන් ලබා ගන්නා රා වලින් හකුරු නිපදවනු ලබයි. ඇතැම් උඩරට ප්‍රදේශවල මෙම කුලයේ අයවලුන් ගොයිගම කුලීනයන් ගේ මංගල අවස්ථාවන්හි දී එයට අදාළ ඇතැම් සේවාවන් ඉටු කිරීමට සාම්ප්‍රදායික බැඳීමක් ඇතැයි සාමාන්‍යයෙන් සැලකේ. මොවුන් මෙකල ඇතැම් ප්‍රදේශයන්හි කිතුල් ගස් මැද හකුරු නිපදවීමෙහි යෙදී සිටින නමුදු එම කර්මාන්තය කිසිදු ආකාරයකින් කුල ඒකාධිකාරය සතු ව පවතින්නක් නොවේ. වර්තමානයේ ඔවුන් වාසය කරන්නේ ද තම අසල්වාසී ගොයිගම ගැමියන්ට නොවෙනස් ආකාරයට ය.

බඩහැල හෙවත් වළං හදන සිංහලයන් සාමාන්‍යයෙන් දක්නට ඇත්තේ සමජාතීය ගමවල හෝ නගර අසල පිහිටි උපගමවල හෝ ගොවිතැන් කටයුතු සිදු කෙරෙන ග්‍රාමයන්හි ය. විශාල කුලයක් නොවන ඊට අයත් ජනයා බොහෝ විට තමන්ගේ සාම්ප්‍රදායික ශිල්පයෙහි යෙදී සිටින නමුදු ඒ සමගම වගා කටයුතුවල ද නිරත වෙති. මෙම කුලය හා බැඳුණු චාරිත්‍රවිධිවලට හෝ උත්සවවලට හෝ අදාළ භූමිකා නොමැති අතර අනෙකුත් කුල සමග ඔවුන් පවත්වන සබඳතාවන් රැඳී පවතින්නේ ඔවුන්ගේ නිෂ්පාදන අලෙවි කිරීම මත ය. ඇතැම් ප්‍රදේශයන්හි ඔවුන්ගේ සේවා සංකේතවත් කරන්නක් ලෙස ප්‍රදේශයේ ගොයිගම පවුල්වලට තම නිෂ්පාදන තෑගි කරන නමුදු මෙම කර්මාන්තයේ දී සාමාන්‍යයෙන් කෙරෙන්නේ පොදු වෙළඳපොළ සඳහා භාණ්ඩ නිපදවීමය.

බෙරවා කුලය හෙවත් බෙර වයන්නාට සිංහල ජනයා අතර හිමිව ඇත්තේ පහත් ස්ථානයකි. ඔවුන් වැඩි ජනකායක් සිටින පහත් කුල අතුරින් එකක් වන අතර ඔවුන්ගේ සේවය නොලබන සිංහල ගම් ඇත්නම් ඒ ස්වල්පයකි. ඔවුහු ප්‍රධාන වශයෙන් අනෙකුත් කුලවලින් සංයුක්ත ව ඇති ගම්වල බොහෝ විට සුළු පිරිසක් වශයෙන් සිටිති. සිංහලයන්ගේ උත්සව අවස්ථාවන්හි වැදගත් අංගයක් වන බෙර වැයීම පන්සලේ ආගමික පූජාවන්හි දී ද ඇතැම් ආකාරයන්හි තොවිල්වල ද බොහෝ විට මගුල්, අවමගුල් සහ අනෙකුත් වැදගත් අවස්ථාවන් හි දී ද අත්‍යවශ්‍ය කාර්යයකි.

ඔලී කුලයේ අයවලුන් විසින් සාමාන්‍යයෙන් පූජාවන් සහ ආගමික උළෙලවල් පවත්වන අවස්ථාවල දී නැට්ටුක්කරුවන් වශයෙන් හෝ ඇඹූ රූප උසුලාගෙන යන්නන් වශයෙන් භූමිකාවක් ඉටු කරනු ලැබ ඇත. එය කුඩා කුලයක් ලෙස සැලකේ. සමජාතිය කුලයක් වශයෙන් ඔවුන් ගම්වල දක්නට ඇත්තේ කලාතුරකින් වන අතර එක් ප්‍රදේශයක් තුළ ඔවුන් සාමාන්‍යයෙන් දක්නට ඇත්තේ ප්‍රමාණාත්මකව අල්ප වශයෙනි.ස්වල්ප දෙනෙකි. එසේම දේවාලගම්වල ඉඩම් භුක්ති විඳින අය විසින් ඒ වෙනුවෙන් ඉටුකළ යුතු පූජෝත්සව සමග බැඳුණු භූමිකාවන් ද ඉටු කරනු ලබයි. ඔලී සහ බෙරවා කුලවලට අයත් වූවන්ගේ භූමිකා නියත වශයෙන් එකිනෙකට වෙනස් වේ.

කින්නර කුලය විශේෂයෙන් පැදුරු සැපයීමේ නිරතව සිටි ඉතා කුඩා කුලයකි. 1909 දී පාකර් විසින් විස්තර කර ඇත්තේ ඔවුන් පැහැදිලි ජනවාර්ගික පිරිසක් බවත් සිංහල කුල ධූරාවලියේ පහළින්ම සිටින ජනයා වන ඔවුන් හැම දෙනා ජීවිකාව ගෙන යන්නේ රටා යොදා පැදුරු විවීමෙන් සහ කුරහන් හා වී වගා කිරීමෙන් බවත් ය (රණසිංහ, 2015). ගමේ ඔවුන් සතුව ඇති ඉඩම් ප්‍රමාණය බෙහෙවින් සීමිත වූවක් වන අතර, ඔවුන්ගේ ප්‍රධාන ආදායම් මාර්ගය වන්නේ අපූර්ව ආකර්ෂණයකින් යුත් රටා පැදුරු විවීම සහ අනියම් කම්කරුවන් ලෙස කුලී වැඩවල නිරත වීම ය.

රොඩී කුලයේ උදවිය තම දිවි පෙවෙත සඳහා සිඟමන් යදිති. මෙම කුලයේ හුදකලා බව බද්ධ ව ඇත්තේ වෙනත් ඕනෑම කුලයකට වඩා වෙනස් ස්වභාවයේ එකක් වන ඔවුන්ගේ සමාජ රටාවන් සහ සංස්කෘතික ලක්ෂණ සමග ය. වර්තමානයේ ඇතැම් ප්‍රදේශවල වෙසෙන රොඩී ජනයා වගා කටයුතුවල නිරත ව සිටිති.

බ්‍රයිස් රයන්ගේ මෙම කුල ධූරාවලියට අමතරව *රොබට් නොක්ස්* විසින් එවක ලංකාවේ පැවැති කුල වර්ගීකරණය පිළිබඳ විස්තරාත්මක ව විග්‍රහ කරයි (කරුණාරත්න, 2001, පි. 205-219). ඒ අනුව,

> "කුලය වූ කලී හව භෝග සම්පත්තියෙන් හෝ රාජදත්ත තාන්න මාන්න වලින් හෝ ඇති වූ දෙයක් නොව ලේ පරපුරෙන් බෙදුණු දෙයක් වෙයි..."මේ රටෙහි වස්තුව හෝ ධනය හෝ

එතරම් ගරු නොවේ. සමහර විට හීන කුලීකයකුට වස්තුවෙන්-ධනයෙන් වංශවත් කුලීකයකු අභිභවන්නට පුළුවන. එහෙත් ඔහුගේ හීන ජන්මය මකා ගන්නට එම වස්තුවෙන් හෝ ධනයෙන් ඔහුට පිහිටක් නොවන්නේ ය...ආවාහා විවාහයෙහි දී ඔවුහු අතිශයින් පරික්ෂාකාරී වන්නෝ ය. ඔවුහු තමන්ගේ ම කුලය හා සමඟ මුත් කිසිම අඩු කුලයක් සමඟ ආවාහා විවාහයෙන් ඥාතිත්වයට සම්බන්ධ නොවෙති. කොතරම් ධන පරිත්‍යාගයක් ලැබුණ ද තමන් හට නොගැළපෙන විවාහයකින්, ස්වකීය ගෞරවය කෙළෙසා ගන්නට සිංහලයෝ කැමති නොවෙති. ගෞරවය නම්බුව ඔවුහු ජීවිතයටම වඩා අගය කරති.” මෙපරිද්දෙන් වංශ හා කුල ගෝත්‍ර අතර කළවමක් හෝ මිශ්‍රවීමක් නොවී සම කුල අතර ආවාහ විවාහ ඇතිවීමෙන් ඒ ඒ වංශයේ-කුල ගෝත්‍රයේ අන්වය හා ගෞරවය ආරක්ෂා වන්නේය. මෙම ප්‍රතිපත්තිය, ඉදින් දුප්පත් හෝ වේවා, පොහොසත් හෝ වේවා දියුණු හෝ නොදියුණු හෝ වේවා එක ලෙසින් ම පවත්නේය. මෙම විවිධ කර්මාන්ත කුලවලට අයත් වූ කම්කරුවෝ ඔවුන්ගේ වෘත්තිය හෝ කර්මාන්තය වෙනස් නොකරති. පරපුරෙන් පරපුරට එම කර්මාන්තයෙහි ම වෘත්තියෙහි ම නිරත විය යුත්තාහ. පියාගේ ඇවෑමෙන් පුතා ගමේ කම්මල් කාරයා, ලෝකුරුවා, ඇත්ගොව්වා වන්නේ ය. දූවරු ද ඒ ඒ වෘත්තිවල නිරත වූවන් හට පාවා දෙනු ලබන්නාහ. කුලීනයෝ ය, කුල හීනයෝ යැයි ප්‍රධාන බෙදීම් ලද මෙම වංශය-කුලය ට ඇතුළත් වූ ප්‍රභේද රාශියක් දැකගත හැකිය. ඒ අනුව එහි ඉහළින් ම පැවතියේ හාන්දුරු පැළැන්තියයි. මීට අමතරව රන් කරුවෝ, ලොහොකරුවෝ, වඩුවෝ, සිත්තරු, ඇත්ගොව්වෝ, ලෝකුරු, පතික්කි, කුඹල්, රජක, හඟරම්, පදු, බෙරවා, කුළු පොත්තෝ, කින්නර, කුරුට්ටෝ, රොඩී යන වංශ හා කුල ගෝත්‍ර දක්නට ලැබුණු බැව් ඔහු සඳහන් කරයි”(කරුණාරත්න,2001, පි. 205-219).

මෙම කුල වර්ගීකරණයන් පිරික්සීමේ දී පැහැදිලි වන්නේ යම් යම් කර්මාන්ත සුවිශේෂී ශිල්ප ක්‍රම ලෙස වැඩි දියුණු වී ඒවාට ආවේණික අතිරේක කුලයන් බිහි ව ඇති බවයි. මීට අමතරව හීන යැයි සම්මත කුල පිළිබඳ හැඳින්වීමක් *සිංහල සිරිත් සංග්‍රහයෙහි* සඳහන් වේ (කරුණාරත්න,2001 පි.20).

| | |
|---|---|
| කරා, පරවර, ඔලිඳ, පලි, රදා, කින්නර, ගහල, | පුක්කුස |
| දුරව, හඟරන්, රොඩී, කම්කරු, වඩදරී, රන්සාද, | නන් රැස |
| නවන්, බරවා, බඩල්, බඩගුල්, පෙහෙරහින්, අද | දනන් රැස |
| තිරා, සග ලෙස හීනකුලවල දනෝයැයි පැවසුවෙන් | හොඳ ලෙස |

ඉහත කාව්‍යයට අනුව සිංහල කුල ධූරාවලියේ හීනයැයි සම්මත කුල රාශියක් පැවත ඇති අතර කරාවේ කුලය හා නවන්දන්වන කුලය සෙසු කුල අභිභවා සිටීම මෙහි විශේෂත්වය විය. මෙම කුලයට ධීවර කටයුතු අයත් ව පැවතිය ද, ගොවිතැන් කිරීම, දඩයම් කිරීම, පටලනු ඇඹරීම යනාදි කටයුතු ද ඔවුන් අතින් සිදුව ඇත. ‘කරාව’ ගොවි කුලයට මිශ්‍රව පැවැති බවත් ඊට පහත සඳහන් උපකුලයන් ගණනාවක් හා විශාල සාමාජික පිරිසක් අයත්ව සිටි බවත් එහි විස්තරාත්මක ව සඳහන් කොට ඇත. ඒ අනුව,

1. හෙල බැඳි කරා
2. කොල බැඳි කරා
3. ගම් බැඳි කරා
4. ටොක් කෙවුල් කරා
5. ඉදමල් කෙවුල් කරා
6. හුණු කරා
7. දූල් කොටු කරා
8. මස් කරා
9. කෙවුල් කරා යනුවෙන් කරාවේ කුලයේ උපකුලයන් රාශියක් පැවත ඇත.

මීට අමතරව පැරණි කුරුණෑගල වාසල වෙනුවෙන් විවිධ රාජකාරි ඉටුකරනු ලැබූ සහ නගරයට අවශ්‍ය ද්‍රව්‍ය සපයා දෙනු ලැබූ විශේෂිත පෝෂක ගම්මාන අතීතයේ පැවති බවට ‘කුරුණෑගල විස්තරය’ සඳහන් කරයි (කුරුවිට, 2015). එහි සඳහන් ආකාරයට,

හැලි මස් දෙන ගම් - යකල්ල, දොරනෑපොල, ඉබ්බාගොමුව
පොළු මස් දෙන ගම් - (දඩයම් කරන ලද සතුන්ගේ මස් හෙවත් දඩමස්) - මඩව, මැහිඇල්ල

පැටවිලි ගම් (ලුණු දෙන ගම්) - තෙලියාගොන්න, මල්ලවපිටිය
තයිලා පෙට්ටි, කුළු වට්ටි, ඇඳ පුටු දෙන ගම් - අහුගොඩ, මයිල්ල
හුන්කිරි දෙන ගම් (ජලය මිශ්‍ර නොකරන ලද පිරිසිදු නැවුම් කිරි) - හෙරලියාවල, මල්කඩුවාව, යට වැහැර, කැත්තමුනේ, ඇටකහවෙල, නැඹිලිකුඹුර

'කුරුණෑගල විස්තරයට' අනුව අතීත සමාජයේ ශ්‍රම විභජනනය හා රාජකාරි සඳහා විශේෂණය වීම පිළිබඳ තොරතුරු අනාවරණය වෙයි. මෙලෙස විවිධ වෘත්තීන්ට අයත් ගම් වෙන් වෙන් වශයෙන් පැවතීම අතීතයේ පටන් ම මෙරට තුළ පැවත තිබේ. තමන් විසින් ඉටුකරනු ලබන වෘත්තියට අනුව ඔවුන්ට විවිධ කුල නාම ද හිමි වී තිබුණි. සමාජයීය අවශ්‍යතාව මත මෙලෙස බඩු බාහිරාදිය සපයන මෙම ගම්මානවලට අමතර ව රජුට අවශ්‍ය සේවාවන් සැපයීම සඳහා කැප වූ කාර්යාංශයන් වෙනුවෙන් වූ ගම්මානයන් ද පැවත තිබේ. ඒ අනුව අස් පන්තිගම (රජුගේ අශ්ව පන්තිය භාරව පැවති ගම) ඇත් පන්ති ගම (රජුගේ ඇත් සේනාංකය භාරව පැවති ගම), දඩමී ගොන් පන්ති ගම (මී ගව පන්ති භාරව තිබූ ගම), කුනම්මඩු ගම (රජුගේ ගමන් යෑම සඳහා භාවිත කළ පල්ලැක්කිය හෙවත් දෝලා සංවිධානය කළ ගම), කුක්කන් මඩුව (සිංහල රජ සමයේ යුද කටයුතු හා දඩයම් සඳහා ඇති කෙරුණු සුනඛයන් රැක බලා ගන්නා ලද ස්ථානය) වශයෙනි. වර්තමානයට අනුව මෙම පැරණි ගම්මාන පිළිබඳ ව අවධානය යොමු කිරීමේ දී කුරුණෑගල වාසලට අයත් කුක්කන් මඩුගම රිටිගස්යාය බව ද, මී ගව පන්ති භාරව පැවති ගම යන්තම්පලාව බව ද, කුනම් මඩුගම යන්න කවුඩාවත්ත බව ද, කුරුණෑගල විස්තරය සඳහන් කරයි. සමාජයේ වූ අනෙකුත් වෘත්තීන්ට අයත් ජනයා පිළිබඳව ද බොහෝ කරුණු මෙම ග්‍රන්ථය මඟින් හෙළිදරව් කොට තිබේ. ගල් වඩුවන්, උළු වඩුවන්, නවන්දන්නා ආචාරි, රදා, බෙරවා, බඩහැල ආදි වෘත්තීන් පිළිබඳව ද "මහ බල ඇමතියන්ගේ ගෙවල් පන්සියයක් හා නළු නාටක ස්ත්‍රීන් වසන ගෙවල් පන්සියයක් හා රදා ගෙවල් අටසියයක් හා තුන් සියයක් බෙරවා ගෙවල් හා අටසියයක් බඩහැලගෙවල් හා සත්සියයක් දඬුවඩු ගෙවල් හා නවසියයක් නවන්දන්නා ආචාරි ගෙවල්......." යනුවෙන් එහි විස්තර වෙයි (කුරුවිට,2015, පි.243-244).

පැරණි ජන සමාජයේ පැවති ශ්‍රම විභජනය තුළින් කාර්යක්ෂමතාව වර්ධනය කරගත් මේ හා සමාන විස්තරයක් පිළිබඳව 'යාපා නුවර විස්තරය' සඳහන් කරයි. එහි සඳහන් ආකාරයට

"ගල් වඩුවන්, මූලාචාරීන්, හන්ගිඩියන්, හිත්තරුන්, ගල්ගානා ආචාරීන් වශයෙන් එකම ක්ෂේත්‍රයක ද විවිධ කාර්යයන් සඳහා විශේෂයෙන් කැප වූ විශේෂඥ පිරිසක් විය. "...මෙසේ අනුරාධපුර සිට අට ගව්වක් ගිය තැන ඇපා මාපා ඇමතියන් පිරිවරා තුන් රාජ්ජයෙන් සෙනඟ ගෙන්නාගෙන යාපා නමින් නුවරක් කරන්ඩ පටන් ගත්තාහ. ....ඒ පරක්කන්බාහු මහ රජ කියනුයේ මේ නුවර ගල්වලින් වැඩ නිම කරවයි කියා වදාළ කල්හි ගණනින් එක් විසිදාහක් පමණ ගල්වඩුවන් හා මූලාචාරීන් සියයක් හා දෙසිය පනහක් හක්ගිඩියන් හා තුන්දාහක් හිත්තරුන් හා හාරදාහක් ගල්ගානා ආචාරීන් හා මෙපමණ ආචාරීන් ලැබී තිබෙන එනුවර අදිකාරං නිලමෙ විසින් කියන ලද 'පෙළක් ගල් කපව, පෙළක් කරු කපව, පෙළක් ගල් නෙළව, පෙළක් ගල් ගාව, පෙළක් පේකඩ නෙළව, පෙළක් හිත්තන් කරව කියා විධාන කළාහා"(කුරුවිට,2015, පි.243-244).

**පර්යේෂණ ගැටලුව**

කුරුණෑගල දිස්ත්‍රික්කයේ සාම්ප්‍රදායික සිංහල ජන සමාජයේ පැවති කුල වර්ගීකරණය, ඒ ඒ කුලය හා බැඳී පැවති කුල සේවාවන් හා එම කාර්යයන් සමාජයට දැක්වූ දායකත්වයත් කුමන ආකාරයක් ඉසිළුවේ ද යන්න මෙහි පර්යේෂණ ගැටලුව වශයෙන් ප්‍රමුඛ කොට ගෙන අධ්‍යයන ගවේෂණයේ නිරත වී තිබේ.

**අරමුණු හා පරමාර්ථ**

කුරුණෑගල දිස්ත්‍රික්කයේ සාම්ප්‍රදායික සිංහල ජන සමාජයේ පැවති සාම්ප්‍රදායික කුල ධූරාවලින් හා ඒ ඒ කුලය හා බැඳී පැවති කුල සේවාවන් මොනවාද යන්න පිළිබඳව විමර්ශනාත්මකව අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණයි.

මෙරට කුල ක්‍රමය සම්ප්‍රදායානුකූලව පාරම්පරික චාරිත්‍ර ධර්ම ආරක්ෂා කොට ගනිමින් පරපුරෙන් පරපුරට පවත්වාගෙන යාමත්, ඊට අදාළ ඒ ඒ වෘත්තීන්වල නිරත වීමෙන් ආර්ථික සංවිධානයේ යාන්ත්‍රණයක් වශයෙන් ක්‍රියාත්මක වූයේ කෙසේ ද යන්න පිළිබඳවත් මෙහි දී අධ්‍යයනය කොට තිබේ.

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙම පර්යේෂණයේ අධ්‍යයනය ක්‍රමවේදය වශයෙන් ක්ෂේත්‍ර ගවේෂණය සහ ක්ෂේත්‍ර නොවන ගවේෂණ භාවිත කෙරිණ. ක්ෂේත්‍ර ගවේෂණයේ දී නිරීක්ෂණය, සහභාගීත්ව නිරීක්ෂණය, ප්‍රශ්නාවලි සහ සම්මුඛ සාකච්ඡා යන

දත්ත රැස් කිරීමේ ශිල්පීය ක්‍රම භාවිතා කළ අතර ක්ෂේත්‍ර නොවන ගවේෂණයේ දී පුස්තකාල පරිශීලනය තුළින් මූලාශ්‍ර අධ්‍යයනය සිදු කෙරිණි.

**ප්‍රතිඵල හා සාකච්ඡාව**

ඈත අතීතයක සබැඳියාවක් පසක් කරමින් කුල ක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඇතැම් පුරාණ ග්‍රාමයන්හි තවමත් ආරක්ෂා වී පවතී. ඒ අනුව එම ග්‍රාමයන්හි වෙසෙන බොහෝමයක් ඇතැම් ජනතාව ඔවුනට ආවේණික කුල චාරිත්‍ර ධර්ම පිළිපදිමින් වාසය කරති. ඒ අනුව පහත ගම්මානවල ඒ ඒ කුලයන් දැනුදු නියෝජනය කෙරෙන අයුරු දක්නට ලැබේ.

| | |
|---|---|
| වාගොල්ල<br>සින්නපාඩු<br>පාලකුඩා | කරා |
| පාලුගම<br>කුමාරගම<br>බඩහැලගම<br>හීනුක්ගල<br>දළුක්ගොල්ල<br>කෝන්ගොල්ල | බඩහැල |
| වැදරගම<br>ගැටිලාව<br>රංචියාගොඩ | රදා |
| කෝන්වැව<br>මීගස්සෑව<br>ඇලියාව<br>වඳුරැස්ස | බෙරවා |
| පන්නගම<br>නබඩෑව | හකුරෝ |

| | | |
|---|---|---|
| ගලගෙදර | - | දුරයි |
| මහව (ලෝකුරුගම) | - | කම්මල්කරුවෝ |
| ඇහැටුවැව (ලෝකුරුගම) | - | රොඩී |
| කෝණාරගම | - | කඹුරෝ |

ශ්‍රී ලාංකේය ප්‍රථම ඉංග්‍රීසි ආණ්ඩුකාරයා වන ශ්‍රීමත් ෆෙඩ්රිතක් නෝර්ත් මෙරට සාම්ප්‍රදායික කුල ක්‍රමය දේශපාලන හා ආර්ථික සංවිධානයේ යාන්ත්‍රණයක් වශයෙන් හැඳින් වූ අතර එය රාජ අණ හා පාරම්පරික චාරිත්‍ර ධර්ම විසින් අතීතයේ ආරක්ෂා කොට තිබූහ (රණසිංහ, 2015). පියාගේ ඇවෑමෙන් පුතා ගමේ කම්මල්කාරයා, ලෝකුරුවා විය. තම දූවරුන් ද ඒ ඒ වෘත්තීන්වල නිරත වූවන් හට පාවා දෙනු ලැබූහ. ලෝහ, කුඹල් කර්මාන්තයන් ද, පැඳුරු විවීම් ද, යකඩ තැලීම හා ධීවර කර්මාන්තයන් ආදි කුඩු මහත් සෑම කටයුත්තක් ම එක් එක් සුවිශේෂී කුලයන්ට අයත් උරුමයක් වශයෙන් පැවත ආයේය. අතීත සම්ප්‍රදායානුකූලව මෙම කුල පරපුරෙන් පරපුරට පවත්වාගෙන යාම අදාළ කුල සාමාජිකයන්ගේ යුතුකම වූ අතර කුලයෙන් බැහැර යම් කර්මාන්තයන්හි නිරතවීම පැවැති සමාජ සම්මත සිරිත්වලට පටහැනිවීමක් විය.

**නිගමන සහ නිර්දේශ**

වෙනස් වෙමින් පවතින සමාජ ව්‍යුහයක් තුළ සිංහල සමාජයේ පැවති පැරණි ඇතැම් කුල අතුරුදහන් වී යමින් පැවතීමේ ක්‍රියාවලිය තුළ පවතින අතර තවත් ඒවා දැනටමත් අතුරුදහන්ව ගොස් ඇත. ඇතැම් උපකුල කණ්ඩායම් පිළිබඳව විමසීමේ දී පෙනී යන්නේ වඩාත් විශාල කුලය තුළ දක්නට ඇති එය වෙන් කර දැක්වීමේ ලක්ෂණ ඒවා තුළින් පිරිහී යමින් පවතින බව ය. මෙම සාම්ප්‍රදායික කුල තත්ත්වයන් වෙනස්වීම කෙරෙහි පසුකාලීන යටත් විජිත පාලන ක්‍රම, වතුවැවිලි අර්ථ ක්‍රමය, යටිතල පහසුකම් දියුණුවීම, මිනිසුන් විවිධ අවශ්‍යතා මත නොයෙකුත් පළාත්වලට සංක්‍රමණය වීම, නාගරීකරණය, වාණිජකරණය, මුදල් අර්ථ ක්‍රමය, ඉංග්‍රීසි භාෂාව, පරිපාලනමය වෙනස්වීම් සහ නව දේශපාලන ක්‍රමයයන් සෘජුව බල පා ඇත. වර්තමානයේ බොහෝ ගම්මානවල විවිධ කුල සාමකාමීව සහයෝගයෙන් ජීවත්වෙති. කුල සිරිත් ගැන ඔවුන් සැලකිලිමත් වනුයේ විවාහය හා ඉඩකඩම් හුවමාරුව වැනි කරුණු කිහිපයක් මුල්කොට ගෙනය. එහෙත් එම කටයුතුවලදී වුවද වෙනස්කම් පිළිබඳව සාකච්ඡා වනුයේ සීමිත වටපිටාවකය. නාගරික නොවූ ප්‍රදේශවල ඉඩකඩම් හුවමාරු වන්නේ ඒ ඒ කුල අතරය. පිටස්තර කුලයක අයෙකු එවැනි ගම්මානයක පදිංචිය සඳහා ඉදිරිපත් වන්නේ ද කලාතුරකිනි. කුල සම්ප්‍රදායන් එක එල්ලේ කඩ කිරීමකට ද ඉදිරිපත් නොවෙති. මෙම සාම්ප්‍රදායික සිංහල කුල ක්‍රමය වර්තමානයේ පන්ති ක්‍රමයකට පරිවර්තනය වෙමින් පවතිනු දැකිය හැකි ය.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**

අමරසේකර, දයා. (1988) ශ්‍රී ලංකා සමාජය, ආරිය මුද්‍රණ ශිල්පියෝ.

කරුණාරත්න, ඩේවිඩ් (2001) එදා හෙළ දිව, සීමාසහිත ඇම්. ඩී ගුණසේන සහ සමාගම.

කුමාරස්වාමි, ආනන්ද කේ, (1962) මධ්‍ය කාලීන සිංහල කලා. (එච්. ඇම්. සෝමරත්න පරිවර්තනය) සංස්කෘතික දෙපාර්තමේන්තුව.

මහාවංසය (සිංහල), ශ්‍රී සුමංගල නාහිමි සහ බටුවන්තුඩාවේ දේවරක්ෂිත පඬිතුමා. (1969), එස් ගොඩගේ සහෝදරයෝ.

මැන්දිස්, පී. සී. (1956) ලංකා ඉතිහාසය (පූර්වභාගය), සීමාසහිත ඇපෝතිකරීස් සමාගම.

රණවැල්ල, සිරිමල්. (2014) පුරාතන ශ්‍රී ලංකාවේ ආර්ථික ඉතිහාසය, සීදේවි ඕෆ්සෙට් ප්‍රින්ටර්ස් ඇන්ඩ් පබ්ලිෂර්ස්.

රණසිංහ, චන්ද්‍ර ශ්‍රී. (2015) සිංහල සමාජයේ කුල ක්‍රමය, සී/ස ඇස් ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.)සමාගම.

රැල්ෆ් පීරිස්, (2001) සිංහල සමාජ සංවිධානය, කේ.ඒ.ඩී. පෙරේරා පරිවර්තනය, විසිදුනු ප්‍රකාශකයෝ.

රංගන කුරුවිට, කේ.ඒ.පී., (2015) කුරුණෑගල විස්තරය, ශාස්ත්‍රීය සංස්කරණය සහ විමර්ශනය, සූරිය ප්‍රකාශකයෝ.